**මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරිදීමනා අරමුදල - 2022**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ත්‍යාග හා දිරි දීමනා අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 08හි අංක 22 අනුව ප්‍රතිපාදනයන් හඳුනාගැනීම සඳහා අවශ්‍ය කිසිදු කොන්දේසියක් සම්පූර්ණ කර නොතිබියදී පුහුණු, අධ්‍යාපන, ක්‍රීඩා, විනෝද, සුභසාධන හා ප්‍රශංසනාත්මක කටයුතු වෙනුවෙන් ප්‍රවර්ථන වර්ෂයේ රු.200,000ක වියදම් වෙන් කිරීමක් සිදු කිරීම හා පසුගිය වසරේදී ද උක්ත විෂය සඳහා රු.200,000ක් වෙන් කර තිබීම හේතුවෙන් වසරේ අතිරික්තය රු.200,000කින් අවතක්සේරු වී තිබූ අතර ජංගම වගකීම් රු.400,000කින් අධිතක්සේරු වී තිබුණි. | අදාළ පුහුණු , අධ්‍යාපන , ක්‍රීඩා විනෝද , සුභ සාධන හා ප්‍රශංසනාත්මක කටයුතු වෙනුවෙන් වෙන් කරන ලද මුදල් රටේ පැවති තත්ත්වය මත වියදම් නොවූවද ඉදිරියේදී සේවක සුභ සාධනය සඳහා වියදම් කිරීමට සිදුවන බැවින් හා එම කටයුතු සඳහා වාර්ෂිකව වෙන් කරනු ලබන්නේ සුළු මුදලක් බැවින් දැනට පවත්නා වියදම් සමඟ සැසඳීමේදී එය ප්‍රමාණවත් නොවන බැවින් වසර කිහිපයක වෙන් කිරීම්වල එකතුවට සමාන මුදලක් ඉදිරි දිනකදී දැරීමට අනිවාර්යයෙන් සිදුවන බැවින් හා එම මුදල නිශ්චිතවම බැවින් වාර්ෂිකව වෙන් කිරීම් ලෙස ගිණුම්ගත කරන ලෙසට පාලක මණ්ඩලය අනුමැතිය ලබා දී ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව කටයුතු කිරීම. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) ප්‍රවර්ථන වර්ෂයට අදාළ වන වියදම් පමණක් වසරේ ආදායමට එරෙහිව ගැලපිය යුතු වුවත් ගිණුම්කරණ අස්ථිත්වය විසින් දැරිය යුතු හෝ දැරිය යුතු බවට බැඳීමක් හෝ නොමැතිව රු.278,547ක පිරිවැයක් පරිපාලන වියදම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කර තිබුණි. | පරිපාලන වියදම්, වෙන් කිරීම් ගිණුමක් වශයෙන් පවත්වාගෙන යාමට පාලක මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත. එබැවින් මුළු මුදලම වියදමක් ලෙස මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයට ඇතුලත් කර ඇත. | උපචිත සංකල්පය අනුව වර්ෂයට අදාල වියදම නිසි අයුරින් හඳුනා ගත යුතුයි. |
| ආ) පෙර වර්ෂය සඳහා සිදු කර තිබූ රු.256,784 ක පරිපාලන වියදම් අධිවෙන් කිරීම සම්මුචිත අරමුදලට ගැලපීමකින් තොරව ප්‍රවර්ථන වර්ෂයේ ආදායමට ගලපා තිබුණි. | පරිපාලන වියදම්, වෙන් කිරීම් ගිණුමේ වියදම් ගෙවා ඉතිරි වූ ශේෂය පාලක මණ්ඩල තීරණ අනුව අවසාන කාර්තුවේ දිරි දීමනාවට එකතු කර ඇත. | වර්ෂයට අදාල ආදායම් සහ වියදම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන තුල හඳුනාගත යුතුයි. |

| | | |
|---|---|---|
| ඇ) 2011 අංක 04 දරණ මෝටර් වාහන (ත්‍යාග හා දිරි දීමනා අරමුදල) නියෝග අංක 3(2) ප්‍රකාරව අරමුදලේ සමස්ථ ඉපයීම්වලින් රඳවා තැබිය යුතු සියයට 5කට අදාළ රු.3,378,195ක අගය මූල්‍ය ප්‍රකාශන තුල වියදමක් ලෙස සටහන් කිරීම හේතුවෙන් කාලච්ඡේදයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2011 අංක 04 දරණ මෝටර් වාහන (ත්‍යාග හා දිරි දීමනා අරමුදල) නියෝග අංක 3(2) ප්‍රකාරව 5%ක මුදල වෙන් කිරීම් වශයෙන් රඳවා ගැනීමට කටයුතු කර ඇත. | කාලච්ඡේදයට අදාල අතිරික්තයෙන් රඳවාගැනීම් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයෙන් ගැලපීමට කටයුතු කළ යුතුය. |
| ඇ) අරමුදලේ ස්ථාවර තැන්පතු තුනකට අදාළව 2022 දෙසැම්බර් 31 දින බැංකුව විසින් ලබාදුන් ශේෂ සනාථන ලිපිය අනුව තැන්පතු ශේෂය රු.75,575,622ක් නමුත් මූල්‍ය ප්‍රකාශන තුල ස්ථාවර තැන්පතු ලෙස රු.77,259,016ක් දක්වා තිබීම හේතුවෙන් ස්ථාවර තැන්පතු ශේෂය රු.1,683,394කින් වැඩියෙන් දක්වා තිබුණි. | මුදල් පදනම මත පොළිය අවසන් ගිණුම සඳහා ඇතුලත් කර නොහැකි බැවින්, ස්ථාවර තැන්පතු පොළිය උපචිත පදනම මත ගණනය කර අවසන් ගිණුම සකස් කිරීමට කටයුතු කර ඇත. | මූලාශ්‍ර ලේඛන මත පදනම්ව ගනුදෙනු නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6 අධිකාරී බලය නොලත් ගනුදෙනු**

| **අධිකාරී බලය නොලත් ගනුදෙනු පිළිබඳ විස්තර** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පාලක මණ්ඩල සඳහා දීමනා ගෙවීමට අදාළව නිකුත් කර ඇති අංක පි.ඊ.බී/ 3/2015 දරණ 2015 ජුනි 17 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව අරමුදලේ පාලක මණ්ඩලය වෙත දීමනා ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් නොතිබියදී, විධිමත් අනුමැතියකින් තොරව අරමුදලේ පාලක මණ්ඩලය සඳහා එකතුව රු.114,000 ක දීමනාවක් ලබා දී තිබුණි. | මෝටර් රථ ප්‍රවාහන පනතේ 213 (ඇ) වගන්තිය යටතේ දිරි දීමනා ආදායමෙන් 1%ක් අරමුදලේ කළමනාකරණ හා පරිපාලන වියදම් වශයෙන් වෙන් කිරීමට ප්‍රතිපාදන සලසා ඇත. ඒ අනුව අරමුදලේ කළමනාකරණ හා පරිපාලන කටයුතු සඳහා දායකත්වය ලබා දෙන පාලක මණ්ඩල සාමාජිකයින්ට මෙම දීමනාව, පාලක මණ්ඩලයේ අනුමැතිය අනුව ගෙවීම් කර ඇත. | අදාල චක්‍රලේඛන අනුව කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ අනුකූල නොවීම ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 I කොටසෙහි 15.1 ඡේදය යටතේ හඳුන්වා දී ඇති | මාර්ගෝපදේශ 02 අනුඡේද 01 පරිදි ව්‍යවස්ථාපිත අරමුදලක සියලු ලැබීම් හා ගෙවීම් විධිමත්ව මූලාශ්‍ර ලේඛන පදනම් කරගෙන සුදුසු උපයෝගී ලෙජර් | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 1 කොටසෙහි 15.1 ඡේදය යටතේ මුදල් රෙගුලාසි 877 (2) හි (ඇ) මාර්ගෝපදේශ 02 අනු ඡේද 01 හා මු.රෙ.445 අනුව හා අරමුදලේ | රාජ්‍ය මුදල් චක්‍රලේඛ වලට අනුව විධිමත් මූලාශ්‍ර ලේඛන මත පදනම්ව සුදුසු උපයෝගී ලෙජර් |

| | | | |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි 877(2) (ඇ) | පොත්වල හා ලෙජර් ගිණුම්වල සටහන් කලයුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ ත්‍යාග හා දිරිදීමනා අරමුදලට අදාළව විධිමත් ලෙස ජර්නල් සටහන් හා ලෙජර ගිණුම් පිළියෙල කර නොතිබුණි. | ස්වභාවය හා අවශ්‍යතාවය අනුව අවශ්‍ය උපයෝගී ලෙජර්, මුදල් පොත, පොදු ලෙජරය, ජර්නල් සටහන්, ආයෝජන ලේඛනය, ලැබීම් ලේඛනය, ගෙවීම් ලේඛනය ආදිය පවත්වාගෙන යන බව දන්වමි. | පොත්වල හා ලෙජර් ගිණුම්වල ගනුදෙනු සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,043,191ක අතිරික්තයක්වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,946,579ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.9,096,612ක වර්ධනයක් නිරීක්ෂණය වන අතර පෙර වර්ෂයට සාපේක්ෂව ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.9,444,464 කින් වැඩිවීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අ) 2011 අංක 04 දරණ මෝටර් වාහන (ත්‍යාග හා දිරි දීමනා අරමුදල) නියෝග මාලාවේ 03(1) නියෝග පරිදි මෝටර් රථ සම්බන්ධ අක්‍රමිකතාවයන් සිදු කරන තැනැත්තන් පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා වෙත තොරතුරු සපයන හා සාවද්‍ය ක්‍රියා සම්බන්ධ තොරතුරු හඳුනාගන්නා /සාවද්‍ය ක්‍රියා අනාවරණය කර ගන්නා පුද්ගලයින් සඳහා ත්‍යාග මුදල් ගෙවීම ප්‍රතිපාදන ඇතුලත් කර ඇතත් මෝටර් රථ සම්බන්ධ අක්‍රමිකතා, දූෂණයන් හෝ අවභාවිතයන් සම්බන්ධ තොරතුරු සැපයීමට ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට, ඒ පිළිබඳ මහජනතාව දැනුවත් කිරීමට හා ත්‍යාග ක්‍රමය සම්බන්ධ තොරතුරු මහජනතාවට දැනුම් දීමට විධිමත් වැඩපිළිවලක් ක්‍රියාත්මක කර නොතිබුණි. | මෝටර් රථ සම්බන්ධ අක්‍රමිකතා සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය වෙත පැමිණිලි කිරීමේ ක්‍රමවේදයක් පවතින අතර එසේ යම් අක්‍රමිකතාවක් පිළිබද තොරතුරු සපයන තැනැත්තන්ට මුදල් ගෙවීම සම්බන්ධයෙන් මෝටර් වාහන (ත්‍යාග හා දිරි දීමනා අරමුදල) නියෝග අංක 3(1) "අ " ප්‍රකාරව ප්‍රමාණවත් ප්‍රතිපාදන ඇත. | අරමුදලේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා විධිමත් වැඩ පිළිවෙලක් සකස් කිරීමට අවධානය යොමු කළ යුතුය. |
| ආ) මෝටර් රථ ප්‍රවාහන පනතේ 213 ඇ (2) වගන්තිය අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් පවරනු ලබන අධිකරණ නඩු යටතේ අයකරනු ලබන දඩ වලින් භාගයක් හා මෝටර් රථ ප්‍රවාහන පනතේ 213 (ඉ) වගන්තිය යටතේ හෝ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ගෙවීමට නියම කරන මුදල් ත්‍යාග අරමුදලට ගෙවිය යුතු වුවත් උක්ත මූලාශ්‍රයන් මඟින් කිසිඳු ආදායමක් අරමුදල වෙත ලැබී නොතිබුණු අතර එකී මූලාශ්‍රයන්ගෙන් | එවැනි මුදල් ලැබීමක් සිදු වූවේ නම් දෙපාර්තුමේන්තුවේ නීති අංශය මගින් හා රේගු දෙපාර්තමේන්තුව මගින් ත්‍යාග හා දිරි දීමනා අරමුදලේ කළමනාකරණය දැනුවත් කිරීමට කටයුතු කරනු ලබන අතර මේ දක්වා එවැනි දැනුම්දීමක් සිදු කර නොමැත. | මෝටර් රථ ප්‍රවාහන පනතේ 213 ඇ(2) වගන්තිය අනුව මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව විසින් පවරනු ලබන අධිකරණ නඩු යටතේ අයකරනු ලබන දඩ, රේගු දණ්ඩන හා අය කිරීම් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට ක්‍රමවේදයක් සකස් කිරීමට |

| | | |
|---|---|---|
| අරමුදල වෙත මුදල් අයකර ගැනීම සඳහා අරමුදලේ කලමණාකරණය විසින් කිසිදු වැඩපිළිවලක් සකස් කර නොතිබුණි. | | කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 12 කට අදාලව අයවැයගත අගයන් හා තත්‍ය අගයන් අතර සියයට 24 සිට 100 සියයට දක්වා විචලතාවයන් පෙන්නුම් කිරීම හේතුවෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය පාලන ක්‍රමයක් ලෙස යොදා ගෙන නොමැති බව නිරීක්ෂණය විය. . | වාහන ආනයනය අත්හිටුවීම, රට තුළ පැවති ආර්ථික අර්බුදය, පොළී අනුපාත වැඩි වීම හේතුවෙන් වාහන පැවරුම් ආදිය අඩුවීම හේතුවෙන් ආදායම අඩු වූ බව සහ රට තුල ඇති වූ ආර්ථික අර්බුදය හේතුවෙන් වියදම් පාලනය කිරීම. | තාත්ත්වික අයුරින් අයවැය ප්‍රතිපාදනයන් සැකසීමට කටයුතු කළ යුතුය. |